අප සමාජයේ ආබාධ සහිතව ජීවත් වන්නවුන් ද සමාජයේම කොටසක්ය යන ආකල්පය තහවුරු කිරීමට නම්, ඔවුන්ව හැඳින්වීමේ නිවැරදි භාෂාවද වැදගත් වන බව Ethics Eye අපි බොහෝ විට පෙන්වා දී ඇත්තෙමු.
නිදසුනක් ලෙසින් ගත් විට, ආබාධ සහිතව ජීවත් වන්නවුන්ව හැඳින්වීමේදී ආබාධය-මූලික කොටගත් භාෂාවක් වෙනුවට, පුද්ගලයාව-මූලික කොට ගත්, පුද්ගල-ප්‍රථම භාෂාවක් (person-first language), නැතිනම් අනන්‍යතාවය-ප්‍රථම භාෂාවක් (identity first language) යෝග්‍ය නොවන්නේ දැයි Ethics Eye අපි අසමු.
ඒ අනුව,
1) පහත පුවත් තුළ දැක්වෙන "ශ්‍රවණාබාධිත" යන යෙදුම, ආබාධය-මූලික කොට ගත් යෙදුමක් නොවන්නේ ද?
2) ඒ වෙනුවට, පුද්ගල-ප්‍රථම භාෂාවකට වඩාත් ගැලපෙන්නේ, "ශ්‍රවණ ආබාධයක් සහිත" වැනි යෙදීමක් නොවන්නේ ද?
මූලාශ්‍ර:
https://ncdj.org/style-guide/
https://pwd.org.au/.../2019/08/PWDA_LanguageGuide_A5_WEB.pdf
https://adata.org/factsheet/ADANN-writing
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න.
නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.

